අංක 4

මිල රු. 1.50 යි.

'මාවත' ප්‍රකාශකයෝ,
අසෝක පොත්හල බාරේ
183, ගාලු පාර,
කොළඹ 4.

# මාවත

ප්‍රගතිශීලී, කලා, සාහිත්‍ය හා සංස්කෘතික ප්‍රකාශනය

මෙවර කලාපයේ

සංස්කෘතික ආක්‍රමණය මෙහි මුල් බැස ගනී —1
—සංස්කාරකවරු

පොත්පත් විවේචන —5

යටත්විජිතවාදයේ කුසෙන් උපන් ජාතිභේදවාදය —7
—සුසිල් සිරිවර්දන

නිර්මාණ: —10
අන්ත දෙකක් – උතුරෙන්...
අපේ කෙනෙක් – සිරිලක් මවුනි –
මීනා – කන්දප්පගෙ පැලට උඩින් –
කුණ්ඩුමනි

පාඨක සංවාදය —13

මහගම සේකර ජනතාව අමතා කළ කථාව —14
—පරාක්‍රම කොඩිතුවක්කු

මාවත සටහන්: —17
ආනන්ද කුමාරස්වාමි
වී. ඩී. ද ලැනරෝල්ගේ අභාවය
1976 ජාතික නාට්‍ය උළෙල

චිත්‍රකථා හා ළමා පාඨක රුචිය —19
—කීර්ති ඒකනායක

කලා විත්ති: —22
නුඹ නාඩන් පුංචි පුතේ
බියගම බෞද්ධ කලා ප්‍රදර්ශනය

මෙහි පළවන ලිපි, ඒ බව සඳහන් කරමින්, සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් යළි පළ කිරීමට විශේෂ අවසරයක් අවශ්‍ය නැත.

සටහන

## සංස්කෘතික ආක්‍රමණය මෙහි මුල් බැස ගනී.



සංස්කෘතික ආක්‍රමණය යනු ආර්ථික හා දේශපාලන ආක්‍රමණ තුළින් පැන නඟින සහ එම සූරාකෑමත්, පීඩනයත් තහවුරු කරන දෘෂ්ටිමය ප්‍රහාරයක්. අද අපේ වැනි රටවලට සංස්කෘතික ආක්‍රමණය කාන්දු කරවන උල්පත් අතර අධිරාජ්‍යවාදය, නව යටත්විජිතවාදය, සමාජ අධිරාජ්‍යවාදය හා ඉන්දියානු ව්‍යාප්තවාදය මුල් තැන ගන්නවා. මේ බව පසුගිය කලාපයේ 'සංස්කෘතික ආක්‍රමණය හඳුනා ගනිමු' යනුවෙන් වූ සංස්කාරක සටහනෙහි දළ වශයෙන් සඳහන් කළා. මේ සටහනෙහි මූලික අරමුණ වන්නේ මෙරට සංස්කෘතික ක්ෂේත්‍රය තුළ එම ආක්‍රමණකාරී ක්‍රියාදමය මුල් බැසගත් අයුරුත්, දැනට ක්‍රියාත්මක වන අයුරුත් විමසා බැලීමයි.

සංස්කෘතික ආක්‍රමණය මූලික වශයෙන් අධ්‍යාපනය, මතවාදය, තාක්ෂණය, සාහිත්‍යය හා කලාව, ජීවන ක්‍රමය, සමාජ සංවර්ධනය වැනි සමාජයේ නිශ්චිත ක්ෂේත්‍රවල ක්‍රියාත්මක වුනත් ඉඩකඩ සීමිත නිසා, මෙම විමසුම අධ්‍යාපනයට හා සාහිත්‍යයට පමණක් සීමා කෙරෙනවා. සංස්කෘතික ආක්‍රමණයට එරෙහිව මෙතෙක් කෙරී ඇති අරගලත්, එය පරාජය කළ හැකි ආකාරයත් ගැන මීළඟ කලාපයේදී සාකච්ඡා කෙරෙනවා.

සංස්කෘතික ආක්‍රමණය ක්‍රියාත්මක වන්නේ මුළුමනින්ම වාගේ යටත්විජිත සමාජයේ මතු මහලේයි; එනම් දේශපාලනය, සංස්කෘතිය, මතවාදය වැනි ක්ෂේත්‍රවලයි. වෙනත් වචනවලින් කියනවා නම් ආක්‍රමණිකයන් විසින් යටත් ජාතියේ ආර්ථික පදනමෙහි නැත්නම් අඩිතාලමෙහි කරනු ලබන සැහැසිකම් හා විපරීතයන් ඒ මත නැඟුණු මතු මහලෙහි පිලිබිඹුවෙන සංකීර්ණ ක්‍රියාදමයකි, සංස්කෘතික ආක්‍රමණය. මෙයිනුත් ප්‍රහාරයේ සමීප හා නිශ්චිත එල්ලය යටත් ජනතාවගේ අධ්‍යාත්මික හා භෞතික සංස්කෘතියයි. මේ අනුව සංස්කෘතික ආක්‍රමණය එල්ලකින ප්‍රධාන මුහුණුවර දෙකකි. පළමුවැන්න, දෘෂ්ටිමය හා අධ්‍යාත්මික මුහුණුවරයි. දෙවැන්න භෞතිකමය මුහුණුවරයි.

(2 වැනි පිටුවට)

## විජිතවාදී කුස උපන් ජාතිවාදය

—සුසිල් සිරිවර්දන

සංස්කාරකවරු: එස්. විජේසූරිය, සිරිල් අභයගුණවර්ධන, සුසිල් සිරිවර්දන, පියල් සෝමරත්න, කුමුදු කුසුම් කුමාර – 1977 ජූලි – දෙසැම්බර්.

## සංස්කෘතික ආක්‍රමණය. . . .

දෘෂ්ටිමය ප්‍රහාරයේ එල්ලය යටත් ජනතාවගේ මනසයි. අදහස්, ආකල්ප, හර, හැඟුම්, මනෝභාවයන් ඔස්සේය එය ගලා එන්නේ. සංස්කෘතික ආක්‍රමණයේ ප්‍රධානම මුහුණුවරත් මෙම දෘෂ්ටිමය හා අධ්‍යාත්මික ක්‍රියාකාරිත්වයයි. පරගැති හා අනුකාරකවාදී මත, න්‍යායයන්, තර්ක, මතවාද, අදහස් උදහස් උපදින්නේ ඒ මගිනුයි. මෙම දෘෂ්ටිමය ක්‍රියාකාරීත්වය විසින් මුළුමහත් ජනතාව ගොදුරු කරගත් විට එය මනෝමය සීමාවන් ඉක්මවූ බලගතු භෞතිකමය බලවේගයක් බවට පත්වෙනවා.

භෞතිකමය මුහුණුවර දැකිය හැක්කේ ජනසන්නිවේදන මාධ්‍යයන් වැනි ක්ෂේත්‍රවල වෙන්ට පුළුවන්; සාම හමුදාව, විවිධ මාදිලියේ සමාජ සේවා ආයතන වැනි සේවාවන් තුළ වෙන්නට පුළුවන්; ඒ වගේම තාක්ෂණය, ජීවන ක්‍රමය, සංචාරක ව්‍යාපාරය වගේ පුළුල් ක්ෂේත්‍රවල වෙන්නට පුළුවන්. සංස්කෘතික ආක්‍රමණයේ මෙම මුහුණුවර දෙකම දළ වශයෙන් මට්ටම් දෙකකින් ක්‍රියාත්මක වෙනවා. එකක් වඩා පැහැදිලියි, නිශ්චිතයි; එළිපිටයි, විවෘත යි. ඒ නිසා හඳුනා ගැනීම හා ඉන් මිදීම පහසුයි. අනෙක් මට්ටම සියුම්; ක්‍රියාත්මක වන්නේ හැංගි හොරා. එය නොදැනුවත්වම ජාතියේ මනසට රිංගා පැලපදියම් වෙන නිසා වඩාත් භයානකයි.

## අධ්‍යාපනය

යටත්විජිතවාදීන් ලංකාව ආක්‍රමණය කරන විට මෙරට තිබුණේ වැඩවසම් අධ්‍යාපන ක්‍රමයක්. එය ජාතික නිෂ්පාදන ක්‍රියාවලියත් සමග එකට බැඳුණු, පාරම්පරික ශිල්ප ඥානයත් දැනේ නිපුණතාවයත් දියුණු කළ ක්‍රමයක් වුනා. නොදියුණු වැඩවසම් කුසකින් බිහිවූවත් එය පොදුවේ දේශීය අවශ්‍යතාවයන්ට සේවය කළා.

1880 ගණන්වලින් ඇරඹී 1940 ගණන් දක්වා දිවෙන යටත්විජිත යුගය තුළ මෙරට අධ්‍යාපනයේ සියලු දේශීය, දේශප්‍රේමී හා ස්වාධීන අංග ලක්ෂණ එකින් එක ඉවත් කෙරෙමින් ඒ වෙනුවට යටත්විජිත අධ්‍යාපනයේ පරගැති, අනුකාරකවාදී අංග ලක්ෂණ ඊට බද්ධ කෙරෙනු දකින්නට ලැබෙනවා. යටත්විජිතවාදීන්ට මෙරට වැසියන්ට අධ්‍යාපනයක් ලබාදීමට අවශ්‍ය වූනේ යටත්විජිත ක්‍රමය පවත්වාගෙන යන්නට ජනතාව වඩාත් ප්‍රයෝජනවත් ලෙස වහල් සේවයේ යොදා ගැනීමටයි; තමන්ට ගැතිකම් කරන පිරිසක් බිහිකර ඔවුන් මගින් තමනට හිතකර මතවාදයක් ලංකාව පුරා පතුරාලීමටයි; පරිපාලනයට අවශ්‍ය වුණු ලිපිකරු සහ වෙනත් වෘත්තීන්හි සේවයට අඩු වැටුපකට සේවයෙහි යොදවාගත හැකි බුද්ධිමතුන් පිරිසක් ස්වදේශිකයන් අතුරෙන් බිහිකර ගැනීමටයි.

ඔවුන් ඒ කටයුත්ත කළේ කොහොමද? තමන්ගේ මව්රටේ අධ්‍යාපන රටාවම මේ රටේ විශේෂ ලක්ෂණ නොසලකා බලහත්කාරයෙන් අප මත පැටවීමෙනි. අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම නිෂ්පාදනයෙන් වෙන්කළා; නගරබදට පමණක් මූලික වශයෙන් සීමාවුණු අධ්‍යාපනය ඒ තුළත් පාසැලේ පන්ති කාමරයටම, පොතපතටම සීමා කළා. ධනවාදයේ උදවත් සමගම ලෝකෙට දයාද වශයෙන් ලැබුණු විද්‍යාවට මෙරට අධ්‍යාපනයේ වැදගත් තැනක් නොදීමෙන් සහ කලා අධ්‍යාපනයට මුල්තැන දීමෙන් ඔවුනට අවශ්‍ය ලිපිකරුවන් බිහිකළා මිස ලංකාවට අවශ්‍යවූ විද්‍යාඥයන් බිහිකළේ නැහැ. රටේ කෘෂිකාර්මික හා කාර්මික දියුණුවට අවශ්‍ය අධ්‍යාපනයක් ලබාදෙනු වෙනුවට තේ, කෝපි සහ රබර් වවන්නට අපට ඉගැන්නුවා. පාසැල්වල උගන්වනු ලැබුවේ මවුරටේ දියුණු, උසස්, ශිෂ්ට බවත්, යටත් රටේ නොදියුණු, පහත්, අශිෂ්ට බවත් ගැනයි. එම අධ්‍යාපනය ජාතික සමගිය බිඳින්නටත්, ආගම්භේද මතු කරන්නටත් යටත්විජිතවාදීන් යොදගත්තේ බෙද පාලනය කිරීමේ ක්‍රමයට රුකුලක් වශයෙනුයි. විශේෂයෙන් අපේ රටේ පැවති බහු ජාතික, බහු ආගමික, බහු භාෂා ස්වරූපය නිසා යටත්විජිතවාදීන්ට මේ කටයුත්ත පහසුවුනා. සිංහල පළාත්වලටත්, වතුකරයටත් පාසැල් අල්පවූ අතර උතුරේ පාසැල් වැඩි සංඛ්‍යාවක් පිහිටෙවුවා. ඒ මගින් සුළු ජාතීන් හුවා දක්වා ඔවුනට උසස් රැකියා ආදිය ලබාගැනීමේ වැඩි වරප්‍රසාද ලබාදී ජාතිභේදවාදී හැඟීම් වගා කළා. නගරබදට පමණක් අධ්‍යාපනය සීමා කිරීමෙන් ගමත් නගරයත් අතර පරතරයක් තහවුරු කළා. වැඩවසම් පාලන සමයන් තුළ රාජ්‍ය අනුග්‍රහය ලබා දියුණුවූ ජාතික භාෂාවන්, පිරිවෙන් අධ්‍යාපනය, බෞද්ධ උරුමය, දේශීය වෙදකම, දේශීය කලා හා කලාශිල්ප, දේශීය තාක්ෂණය හා විද්‍යාව වැනි සියල්ලම යටපත් කළා. ඒ වෙනුවට ක්‍රිස්තියානි ආගමටත් මිෂනාරී අධ්‍යාපනයටත් රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලබා දුන්නා.

යටත්විජිතවාදීන් විසින් මෙසේ අපේ ජාතික අධ්‍යාපනය ආක්‍රමණය කිරීමත් සමගම ලාංකික ජනතාවගේ ජාතික ලකුණ, ජාතික අනන්‍යතාවය නැතිවී යන්නට පටන් ගත්තා. නිර්මාණ ශක්තිය මොටවුනා; ඉතිහාසය සියතින්ම ගොඩනැගීමේ වරම ලාංකිකයන් වෙතින් උදුරාගනු ලැබුවා; ජාතිකවූ හැමදෙයම මෙම අධ්‍යාපන ක්‍රමය මගින් රෝගී බවට පත්කළා; විකෘති කළා; ජාතික නිෂ්පාදනය අවවර්ධනය වෙත යොමු කළා. ජාතියේ මනස තුළ යටත්විජිතවාදයේ පරගැති, අනුකාරකවාදී හංවඩුව මකා දමන්නට අපහසු ලෙසින් සටහන් කෙරුණා; සාමූහිකත්වය වෙනුවට පෞද්ගලිකත්වය ඉස්මතු කර දක්වන, බහුතරය පාගාදමා සුළුතරයක් ඉස්මතු කරවන, ජාතික සංවර්ධනයට අවහිරවන හරයි මේ අධ්‍යාපන ක්‍රමයෙන් පෝෂණය කෙරුණේ.

1948 න් ඇරඹී අද දක්වා දිවෙන නව විජිතවාදී යුගයේදී මෙරට අධ්‍යාපනය තුළ යටත්විජිතවාදී සංස්කෘතික ආක්‍රමණය වඩා සියුම්ව හා ප්‍රබලව ඔඩු දුවන අයුරු දැකිය හැකියි. මේ වනවිට යටත්විජිතවාදීන් සහ දේශප්‍රේමීන් අතර පැවති මූලික ප්‍රතිවිරෝධය, අධිරාජ්‍යගැති ධනපති සහ රදළ පංතීනුත්, දේශප්‍රේමී ජනතාවත් අතර ප්‍රතිවිරෝධයක් බවට වෙනස් වෙනවා. මේ යුගයේ මුල් අවධියේත් ඉංග්‍රීසියට, ක්‍රිස්තියානි ආගමට, නගරයට තිබූ තැන තවදුරටත් රැකුණා. ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසුව, උසස් අධ්‍යාපනයට වරම් නොලබා රැකියා විරහිත වූවන් වශයෙන් සමාජයට පා තබන පිරිස නිෂ්පාදනය සම්බන්ධයෙන් 'කිසිත් නූගත්' නිෂ්පාදනයට හවුල්වීම පහත් කටයුත්තක් සේ සිතන්නට පෙළඹවූ පිරිසක් වුනා. අනිත් අතට උසස් අධ්‍යාපන කඩුල්ලෙන් පැනගත් පිරිස මුළුමහත් පොදු සමාජයෙන් ඈත්ව ඉහළ තලයකට පියමං කළ ප්‍රභූ පංතියක් බවට පත්වුනා.

මෙම යුගයේ අධ්‍යාපන ක්‍රමයෙහි ප්‍රතිසංස්කරණ හා සංශෝධන ඇති කිරීම තුළින් යම් යම් ජයග්‍රහණ ලබා ඇති බව අමතක කළ යුතු නැහැ. 1931 ට පසුව අධ්‍යාපනය හැසිරවීමට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දේශීය ඇමතිවරු පත්වීමත්, ආණ්ඩුව මගින් වැඩිපුර සුභසාධක පිළිවෙත් අනුගමනය කිරීමත් සමග ඇතිවුනු වෙනස්කම් ඔස්සේ **1943 දී බිහිවූ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ඉන් එක් වැදගත් ජයග්‍රහණයක්.** 1956 දී ස්වභාෂා අධ්‍යාපනයට දොර පුළුල්ව විවරවීමත්, පිරිවෙන් විශ්ව විද්‍යාල ඇරඹීමත් සමග එතෙක් ඉංග්‍රීසියටත්, මිෂනාරි පාසැලටත් ලැබී තිබුණු තැන වෙනස්වී අධ්‍යාපන ක්‍රමයේ බාහිර ස්වරූපයේ වෙනසක් ඇතිවූවත් හරය තවදුරටත් නොවෙනස්ව පැවතුණා.

අද අපේ අධ්‍යාපන ක්‍රමය තුළ සංස්කෘතික ආක්‍රමණය ක්‍රියාත්මකවන බලවත්ම ආකාරය තමා **ශාස්ත්‍රීය යටත්විජිතවාදය.** ශාස්ත්‍රීය යටත්විජිතවාදය කියන්නේ නව යටත්විජිතවාදීන් මෙහෙයවන දැනුම මාධ්‍ය කරගත්, අපේ සිතීමේ නිදහස ඔවුන්ට වාසි වන විදිහට හැඩගස්වන නව පන්තියේ පාලන ක්‍රමයටයි. ශාස්ත්‍රීය යටත්විජිතවාදය උපත ලබන්නේ නව යටත්විජිතවාදීන්ගේ සරසවි වැනි උසස්ම මට්ටමේ අධ්‍යාපන ආයතනවලයි. එවැනි තැන්වලින් කෙරෙන්නේ අපේ සිතීමේ ක්‍රම නැත්නම් ක්‍රම විද්‍යාවන් නිර්මාණය කර, අපේ උගතුන් තුළට ඒවා ඇබ්බැහි කරවීමයි. එම ක්‍රම විද්‍යාවන් මුල්කරගෙන අපේ උගතුන් මෙරට සමාජ යථාර්ථය දිහා බැලීමෙන්, එහි සැබෑ හරය, ප්‍රතිවිරෝධතාවයන් ඔවුන්ට ග්‍රහණය කර ගන්න බැහැ. ඔවුන් ඇත්තෙන්ම කරන්නේ නව යටත්විජිතවාදියාට උවමනා විදිහට, ඇබ්බැහිකර ඇති මිනුම් අනුව අපේ සමාජ යථාර්ථය තේරුම් බේරුම් කිරීමයි. මේ අන්දමට නව යටත්විජිතවාදීන් තම වක්‍ර ආධිපත්‍යය අපේම බුද්ධිමතුන් ලවා අදිසිව පවත්වාගෙන යනවා.

උගතුන් රට හැර යාම නැත්නම් බුද්ධි ගලනයද ශාස්ත්‍රීය යටත්විජිතවාදයේ අතුරු ඵලයක්. එහිදී වෙන්නේ අපේ වියද-

මෙන් නිපදවාගත් දනුම නමැති භාණ්ඩය නව යටත්විජිතවාදීන් විසින් කුණුකොල්ලයට ගැනීමයි. නව යටත්විජිතවාදී රටවල උගතුන් ක්‍රම ක්‍රමයෙන් වඩා උසස් බුද්ධි තලවලට යොමුවන කොට හිස්වෙන පහත් තලවල පාළු පිරවීමයි රටහැර යන අපේ උගතුන් කරන්නේ. ඒ නිසා ශාස්ත්‍රීය යටත්විජිතවාදයට එරෙහිව ගෙනයන අරගලය යනු **දනුම නිපදවීමේ ක්‍රියාදාමයත් සියල්ල අපේ පාලනයට ගෙන ස්වාධීනත්වය තහවුරු කර ගැනීමේ අරගලයකි.**

අපේ අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන් ජාතික අවශ්‍යතාවයන්ට පටහැනිව, අප මත බලෙන් පටවන ලද සතුරු ස්වරූපයේ ආක්‍රමණයක් වුවත්, එහි හානිකර මෙන්ම ප්‍රගතිශීලී ලක්ෂණද එකසේ පවතින බව අප පිළිගත යුතුය. හානිකර වන්නේ, එය නව යටත්විජිතවාදයේ අතකොළුවක්වීම නිසයි. ඒ අතරම මෙම අධ්‍යාපනය අපේ ධනවාදී සංවර්ධනයත් සමඟ ගමන්ගත් බවත්, වැඩවසම්වාදයට සාපේක්ෂව එහි ප්‍රගතිශීලී ලක්ෂණ තිබෙන බවත් සැබෑය. ධනවාදයේ උදවත් සමඟ ලොවට දයාද වූ විද්‍යාව, මානවවාදය, ඓහිකකරණය වැනි ප්‍රගතිශීලී අංග ලක්ෂණ ද ගලා එන්නේ මෙම අධ්‍යාපන ක්‍රමය තුළින්ම හෙයිනි.

## සාහිත්‍යය

යටත්විජිතවාදය හාපුරා කියා අපේ රටට පා තැබූ ද ඉඳලමයි සංස්කෘතික ආක්‍රමණය පටන් ගත්තේ. විවිධ අවධි පසුකරමින්, විවිධ මං ඔස්සේ, විවිධ හැඩරුව ගනිමින්, විවිධ දේශීය සංවිධාන හා පුද්ගලයන් හරහා ගලා ආ සංස්කෘතික ප්‍රහාරයමයි අදත් අපේ සාහිත්‍ය තුළ එක් පැත්තකින් ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා අප මෙහිදී කරන්නේ සංස්කෘතික ආක්‍රමණයට ගොදුරුවීමෙන් විපරීතවූ අපේ සාහිත්‍ය වංශකථාව දක්වනවා වෙනුවට නව යටත්විජිතවාදී යුගය තුළ සිංහල සාහිත්‍යයේ සංස්කෘතික ආක්‍රමණය ක්‍රියාත්මක වූ එක් නිශ්චිත අවස්ථාවක් – එනම් පේරාදෙණි සාහිත්‍ය ගුරුකුලය – ගැන විමසා බැලීමයි.

පේරාදෙණි ගුරුකුල සාහිත්‍යය පලදරු කාලය 1942–1969 දක්වායයි සීමා කරන්න පුළුවන්. එය එළිදුටුවේ 1942 දී ලක් සරසවිය පිහිටුවීමත්, 1943 දී සරච්චන්ද්‍රගේ 'මොඩන් සිංහලීස් ෆික්ෂන්' විචාර ග්‍රන්ථය පළවීමත් සමගයැයි කියන්නට පුළුවන්. ඊට එරෙහිව ප්‍රගතිශීලී බුද්ධිමතුන් සහ ජනතාව ගෙනගිය සංස්කෘතික අරගලය පලදරා පේරාදෙණි ගුරුකුලය බිඳවැටීම 1969 වනවිට ඇරඹී තිබුණා. 'සිංහල නවකථාව සහ ජපන් කාමකථා හෙවනැල්ල' තුළින් මාර්ටින් වික්‍රමසිංහ කළ හෙළිදරව්වත්, මුලදී පේරාදෙණි ගුරුකුලයේ පතාක යෝධයෙකුව සිට ඉන් 'එළියට' ආ ගුණදාස අමරසේකර කළ සුප්‍රකට 'පාපෝච්චාරණයත්, මේ බිඳවැටීම සළකුණු කළ සිද්ධි දෙකක්. පේරාදෙණි සාහිත්‍යය තුළින් සංස්කෘතික ආක්‍රමණය ක්‍රියාත්මකවීමට හේතු කාරක වුනේ නව යටත්විජිතවාදයේ බලපෑමයි. නිදහස ලැබීමට මඳකට කලින් බිහිවූ පේරාදෙණි සාහිත්‍යය මුහුකුරා වැඩෙන්නේ ඉන්පසු දශක තුනක පමණ කාලසීමාවක් හරහායි.

නව යටත්විජිතවාදයෙන් පීඩාවිඳින රටක සංස්කෘතික ආක්‍රමණයේ ක්‍රියාකාරීත්වයට මූලිකවන කරුණකි, සාහිත්‍යකරුවා **තම සමාජයේ ඉතිහාස ක්‍රියාදාමයට සම්බන්ධවන ආකාරය.** ඔහුගේ ඒ සම්බන්ධය රඳා පවතින්නේ ඔහු තම මව්බිමේ **අභ්‍යන්තර සාධකය** මත පිහිටා සිටින ප්‍රමාණය අනුවයි. අභ්‍යන්තර සාධකය යනු රටක ඉතිහාසය තීරණය කළ හා තීරණය කරන රටේ ජනතාව ප්‍රමුඛ සියළු අභ්‍යන්තර ක්‍රියාදාමයන්හි එකතුවයි. මේ අනුව ලංකාව වැනි නව යටත්විජිතවාදී රටක සාහිත්‍යකරුවා අභ්‍යන්තර සාධකය මත පිහිටා සිටින ප්‍රමාණයට ඔහු සංස්කෘතික ආක්‍රමණයෙන් මිදෙනවා. බාහිර සාධකය නැත්නම් නව යටත්විජිතවාදී හා අධිරාජ්‍යවාදී බලවේග මත යැපෙන තරමට සංස්කෘතික ආක්‍රමණයට ගොදුරු වෙනවා; එහි අතකොළුවක් වෙනවා. පේරාදෙණි ගුරුකුලය බොහෝදුරටම යැපුනේ නව යටත්විජිතවාදය මතයි. එය මූලිකව ගොඩනගා තිබුනේ බාහිර හර, ප්‍රමිති, විධික්‍රම, න්‍යායයන් හා ගුරුහරකම් මතයි. යටත්විජිතවාදය ඔස්සේ ආ අනුභූතිකවාදය, හේතුවාදය වැනි මතවාදයන් තුළිනුයි ශක්තිය උරා ගත්තේ. මෙහි විපාකයකි අනුකාරකවාදය. මෙසේ නව යටත්විජිතවාදී බැම්මට හසුවූ සාහිත්‍යකරුවා යටත්විජිත හරණයේ ක්‍රියාදාමය තේරුම් ගැනීමට අසමත් වුණා. ඔහු සංස්කෘතික ආක්‍රමණයෙන් මිදෙනවා වෙනුවට එම විනාශකාරී ක්‍රියාදාමය තුළ තව තවත් හිරවුණා, සංස්කෘතික අදීනත්වය කෙළෙසා ගත්තා.

මේ තත්ත්වය යටතේ ඔහුට **සමාජ යථාර්ථයවත්, සමාජ අවශ්‍යතාවයවත් හරිහැටි තේරුම් ගන්නට බැරිවුනා.** සමාජ යථාර්ථය කියන්නේ සමාජයක ඓතිහාසික ක්‍රියාදාමය තුළ පවතින මූලිකම සාධකවල සමස්ථයටයි. කිසියම් යුගයක බහුජනතාවට හිතකර ලෙස සමාජ සංවර්ධනය සලසන මූලික අවශ්‍යතාවයන් සමූහයයි සමාජ අවශ්‍යතා යනුවෙන් හැඳින්වෙන්නේ.

පේරාදෙණි ගුරුකුලයේ බුද්ධිමතුනට මේ දෙකම තේරුම් ගන්නට පුළුවන් වුනේ ඉතාම අල්ප වශයෙනුයි. ඔවුන් හා ජනතාව අතර තිබුනේ දුරස්ථ සම්බන්ධයක් වීමයි ඊට හේතුව. මේ නිසා ඔහු හාත්පස සමාජයේ ප්‍රතිවිරෝධතා, අරගල හා ප්‍රශ්න තේරුම් ගන්නට අපොහොසත් වුනා. ඔහු දක්කේ ලාංකික සමාජයේ සීමිත බුද්ධිමතුන් කොටසකගේ පුද්ගල යථාර්ථය පමණයි. පනස්හයේ සමාජ පෙරළිය ඉස්මතු කළ සමාජ අවශ්‍යතාවයන් හා සිතුම් පැතුම් ඔහුට කිසිසේත්ම හසු කර ගන්නට බැරිවුණා. සමාජය වේගයෙන් ඉදිරියට යන බව සහ එහි ගතිකත්වය ඔහු දක්කේ නැහැ. ඒ වෙනුවට ඔහු දක්කේ කල්පනා ලෝකයක්, පරාජිත බවක්, නරුමවාදයක්, මනෝමය වංක ගිරියක්. අරවින්ද, ජිනදාස, රණතුංග, පොඩි අයියා, දෙවොන්දරා සං වැනි ජීවන අරගලයෙන් පැනයන පරාජිතයන්, නරුමයන්, කාමාතුරයන් වැනි චරිත නවකථාවට අරක් ගත්තේ එහි විපාකයක් වශයෙනුයි. මොවුන් සියල්ලම සමාජයට පිටින්, ඉන් පලාගොස් තමාගේ ඇතුල් හද වෙත හැරී ජීවත්වන්නට තැත්කරන්නන්ය. මේ අනුව **විෂයමූලව ගත්විට පේරාදෙණි කලාකරුවන් හාත්පස සමාජය පරිණතව වටහා ගත්තේ නැහැ.**

දෘෂ්ටිමය වශයෙන් ඔවුන් **විඥානවාදී අනුභූතිකවාදීන්ය;** නැත්නම් කල්පිතවාදීන්ය. ඔවුන් නිර්මාණකාරියට වගේම විචාරයටත් මෙහෙයුවේ එම අනුභූතිකවාදයත්, කල්පිතවාදයත් විසිනුයි. ඔවුන්ට අවට සමාජය, ඉතිහාසය, ජනතාව පිරිපුන්ව තේරුම් බේරුම් කර ගැනීමට තරම් ප්‍රමාණවත් බුද්ධිමය උපකරණ තිබුනේ නැහැ. හසුකර ගත් අල්ප යථාර්ථය හා අත්දැකීම් පවා පේරාදෙණි නවකථාව තුළ **මනෝමය කරණයකට** හසුකර ඇත්තේත්, මනසේ උත්පාදනය කළ මනෝමය යථාර්ථයකට යටත්කර ඇත්තේත් ඒ අනුවයි. යථාර්ථයේ හරය හසුකර ගැනීමට අසමත්වීමේ තවත් විපාකයක් වශයෙනි, ඔවුන් **ආකෘතිවාදීන්** නැත්නම් විලාසවාදීන් බවට පත්වුනේ. මේ නිසා **නිර්මාණකරණයේදී හරය මරාගෙන ආකෘතිය ඉස්මතු වුනා.** මනෝමූල අන්තර්ගතයට වාහනය වී ඇත්තේ යථාර්ථවාදී විධික්‍රමයකි. නවකථාවේ වගේම නිසඳැස් කවියේත් හරය හා විලාසය අතර අසමබරතාවයක් මතුවන්නේ ඒ නිසයි.

පේරාදෙණි ගුරුකුලයේ සීමාවන් හා අඩුලුහුඬුකම් අපූරුවට ඉස්මතු වන්නේ මාර්ටින් වික්‍රමසිංහ සමග සසඳන විටයි. වික්‍රමසිංහ තම සංස්කෘතික අදීනත්වය පාවා දුන්නේවත්, අභ්‍යන්තර සාධකයෙන් බැහැර ගියේවත් නැහැ. ඔහුට සංස්කෘතික ආක්‍රමණයෙන් විදීමට පුළුවන් වුනේ ඒ නිසයි. මෙය තීරණාත්මක වෙනසක්. වික්‍රමසිංහ බාහිර සාධකය පිටු දක්කෙත් නැහැ. ඉන් අවශ්‍ය පරිදි ප්‍රයෝජන ගත්තා. සැබෑ **සමාජ සංවර්ධනය යනු ඇතුළත සාධකය මත දැඩිව පිහිටා බාහිර සාධකය සමග අත්වැල් බැඳගෙන යන ඉදිරි ගමනක් බව ඔහු නිවැරදිව තේරුම් ගෙන තිබුණා.**

පේරාදෙණි ගුරුකුලයේ කෙටි ඉතිහාසය දිහා විෂයමූලව බලනකොට අපට කරුණු කීපයක් පැහැදිලි වෙනවා. පේරාදෙණි සාහිත්‍යකරුවන් සහ ජනතාව අතර ඇත්තේ දෙබිඩි හා බිඳුනු සම්බන්ධතාවයක්; ජන ජීවිතය හා දුරස්ථ බැඳීමක්. විෂයමූලව ඔවුන් ජනතාවගෙන් වෙන්වෙලා. සාහිත්‍යය තුළින් ජනතාව අමතන්නේ මනෝමූලවයි.

ඔවුන් තුළ එක්තරා දේශප්‍රේමයක් හා ලිබරල්වාදී දෘෂ්ටියක් තිබෙන බව ඇත්ත. ඔවුන් කොම්ප්‍රදෝරු බුද්ධිමතුන්ගේ තත්ත්වයට වැටෙන්නෙ නැහැ. සරච්චන්ද්‍රගේ නාට්‍ය හා විචාරයත්, සිරි ගුනසිංහගේ චිත්‍රපට හා විචාරයත්, ගුණදාස අමරසේකරගේ නවකථාවල ගම හා මධ්‍යම පංතිය නිරූපණයවී

## සංස්කෘතික ආක්‍රමණය....

ඇති අයුරුත් මීට සාක්ෂි දරනවා. මේ අනුව ඔවුන් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ කොටස් කරුවන් වෙනවා. ඔවුන් සංස්කෘතික ආක්‍රමණයේ ගොදුරු බවටත් එහි අතකොළු බවටත් පත්වෙලා තියෙන්නේ අනියම්වයි.

හැත්තෑව දශකය තුළදී පේරාදෙණි ගුරුකුලය ඇතුළතින්ම බිඳී විසිරෙන ලකුණු පහළවී ඇතත්, එහි හානිකර බලපෑම් හෝ එහි අනුගාමිකයන් වෙනත් මුහුණුවරින් තවමත් සංස්කෘතික ආක්‍රමණයට සේවය කිරීම නැවතිලා නැහැ. ඒ විතරක් නොවෙයි. ජනතාවගේ පැත්තෙන් ප්‍රගතිශීලී බුද්ධිමතුන් විසින් දියත්කර ඇති සංස්කෘතික අරගල අස්සෙම අපේ සාහිත්‍යය තුළ තවමත් සංස්කෘතික ආක්‍රමණය විවිධ හැඩරුවින් හා නානා මාදිලියේ සංවිධාන තුළින් ක්‍රියාත්මක වෙමින් පවතින බවද අප අමතක නොකළ යුතුයි.

## ඉන්දියානු ව්‍යාප්තවාදය

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් ලාංකීය වතු ආර්ථිකයේ සේවයට යොදවාගනු ලැබූ දකුණු ඉන්දීය ද්‍රවිඩ ජනතාව ලක්‍ෂ ගණනක් අද ලාංකීය පුරවැසිකම් ලබා සිටිනවා. මේ හැර ලංකාවේ වසන ලක්‍ෂ සංඛ්‍යාත ද්‍රවිඩ ජනතාවගේ මවුබසත් දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජනතාවගේ මවුබසත් දෙකම එකක්වී තිබෙනවා. දෙරට අතර ඇති ඓතිහාසික සබඳතාත්, මෙම සාධකත් ප්‍රයෝජනයට ගනිමින් උතුරු සහ දකුණු ඉන්දියානු මහධනපති පංතිය ආර්ථික වශයෙන් ලාංකීය වෙළෙඳපොළ සූරාකෑමට ඔවුන්ගේ චිත්‍රපට සහ නවකථා, පුවත්පත්, සඟරා ආදී සාහිත්‍ය ප්‍රකාශන යොදගෙන තිබෙනවා. මේවා ප්‍රචාරය කිරීම තුළින් තමනට හිතකර මතවාදයක් ලංකාව තුළ ගොඩනඟන්නට සමත්වී ඇති ඔවුන් ඒ තත්ත්වය ඉදිරියට ගෙනයන්නට සමස්ත ඉන්දියා ගුවන් විදුලි සේවය වැනි සේවාත්, තමන්ගේ දේශපාලන මත පතුරුවන්නට ඩී. එම්. කේ. (ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම්) සහ අන්නා ඩී. එම්. කේ. (අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම්) වැනි ජාතිවාදී දකුණු ඉන්දීය දේශපාලන සංවිධානත් යොදා ගනිමින් ඉන්නවා. මේ මතවාදයට සේවය කරන ලාංකීය ද්‍රවිඩ මහ ධනපති පංතියත්, රදළ වාදයට නැඹුරුවූ කොටසුත් තම පුවත්පත්, දේශපාලන සංවිධාන හා කලා, සාහිත්‍ය ප්‍රකාශන මගින් මේ ආක්‍රමණයට අනුබල දෙන්නේ ඉන්දියානු මහ ධනපති පංතියේ චින්තනය මෙරට පැතිරවීමෙනුයි.

ඉන්දියානු ව්‍යාප්තවාදීන් විසින් පොදුවේ ලංකාව මත බලපවත්වන මේ ආක්‍රමණය ලාංකීය ද්‍රවිඩ ජනතාව පමණක් එල්ල කරගත්තක් නොවෙයි. එයට සිංහල ජනතාවත් එකසේ ගොදුරුවී සිටිනවා. අධිරාජ්‍යවාදී, රදළ සහ ධනපති පීඩනයට හසුව දුක් විඳින සියයට අනූවකට කිට්ටු ඉන්දීය ජනතාවගේ ජීවිතයේ හාත්පස පැතිර පවත්නා සමාජ යථාර්ථය ග්‍රහණය කරගන්නේ නැතුව, එක් අතකින් රදළ නටඹුන් රකින්නටත්, අනික් අතින් ජනතාව වින්දනවාදී, කල්පිත මනෝ ලෝකවලට ගෙනයන්නටත් උතුරු සහ දකුණු ඉන්දියානු චිත්‍රපට ක්‍රියාත්මක වෙනවා. දකුණු ඉන්දියානු සිනමාවට දාව උපන් ලාංකීය සිනමාව ඒ ග්‍රහණයෙන් මුදවා දේශීය, යථාර්ථවාදී සිනමාවක් කරා ඉදිරියට ගෙන යන්නට දීර්ඝ කාලයක් තිස්සේ කෙරෙන අරගලය මේ ආක්‍රමණයේ හානිකර බවට හොඳම නිදසුනක්. දෙමළ බස කථාකරන නිසා මේ ආක්‍රමණය ලාංකීය ද්‍රවිඩ ජනතාව මත වැඩි බරකින් පැටවෙනවා. පුද්ගල වීරයන් අභිනන්දනයට ප්‍රේක්‍ෂකයන් යොමු කරමින් ඒ තුළින් ඩී. ඇම්. කේ. වැනි ප්‍රතිගාමී දේශපාලන සංවිධානවල මතවාද මේ චිත්‍රපට තුළින් ලාංකීය ද්‍රවිඩ ජනතාව තුළට කාන්දු කරවනවා. ලාංකික සිංහලයන් පවා එම්. ජී. රාමචන්ද්‍රන් වැනි නළු-දේශපාලකයන් අභිනන්දනයට යොමුවී තිබීම මේ තත්ත්වයේ ඇති බරපතළකම පැහැදිලි කරනවා.

උතුරු ඉන්දියානු හින්දි චිත්‍රපට ලාංකීය සිංහල චිත්‍රපට කර්මාන්තයේ මෙන්ම සිනමා කලාවේද උන්නතියට හරස්වී ඇතිවා සේම, දකුණු ඉන්දියානු ද්‍රවිඩ චිත්‍රපට ලාංකීය දෙමළ චිත්‍රපට කර්මාන්තයක් බිහිවීමට කෙලින්ම හරස්වෙලා තිබෙනවා. ඉන්දියාවේ උතුරෙන් මෙන්ම දකුණෙනුත් මෙහි එන සඟරා, පුවත්පත්, නවකථා ආදී සාහිත්‍ය නිර්මාණත් සංස්කෘතික ආක්‍රමණයට මෙලෙසින්ම සේවය කරනවා. මෙම සංස්කෘතික ආක්‍රමණය විසින් අද ලාංකීය ද්‍රවිඩ ජනතාවගේ මතවාදය සහ චින්තනය මත ඒකාධිකාරී ආධිපත්‍යයක් බලපවත්වනවා. ඒ නිසාම අදීන ලාංකීය ද්‍රවිඩ සිනමාවක්, සාහිත්‍යයක්, කලාවක් ගොඩනැඟීමේ ඉඩකඩ ඇහිරිලා, ලාංකීය ද්‍රවිඩ කලා කෘති වශයෙන් බිහිවන නිර්මාණද වැඩි හරියක්ම හුදෙක් දකුණු ඉන්දීය අනුකරණයන් බවට පිරිහිලා. මෙලෙසින් ලාංකීය දෙමළ ජනතාව, රටේ යථාර්ථයෙන්, දේශපාලනමය හා සමාජමය වශයෙන් ඈත් කරන්නට ඉන්දියානු ව්‍යාප්තවාදය සමත්වී ඇති නිසා ඔවුන් තමන් දකුණු ලංකාවට වඩා දකුණු ඉන්දියාවට සමීපයැයි හිතන්නටත්, දැඩි ලෙස ජාතිවාදයට නැඹුරුවන්නටත් මේ තත්ත්වයත් සරුබිමක් වී තිබෙනවා. ජාතිභේදවාදයේ බීජ වැපිරීමේ ප්‍රධාන සාධකයක් වෙලා තියෙන්නෙත් මෙම සංස්කෘතික ආක්‍රමණයමයි.

## සමාජ අධිරාජ්‍යවාදය

දැනට දශක දෙකක විතර ඉඳලා සෝවියට් සමාජය වේගයෙන් ධනවාදය කරා ආපසු ගමන් අරඹා ඇති බව ප්‍රකට කරුණක්. එහි නිලධාරී පැලැන්තිය ධනේශ්වර පංතියක් බවට පිරිහිලා සෝවියට් සංගමය තුළ ධනවාදය වපුරමින් ඉන්නවා විතරක් නොවෙයි, නොයෙක් උපාය උපක්‍රම හා විවිධ මං ඔස්සේ නැගෙනහිර යුරෝපය හා තුන්වෙනි ලෝකය පුරා තම ආධිපත්‍යය ව්‍යාප්ත කරමින් ඉන්නවා. කොටින් කියතොත් අද සෝවියට් සංගමය කටින් සමාජවාදයත්, ක්‍රියාවෙන් අධිරාජ්‍යවාදයත් පතුරුවන අධිරාජ්‍යවාදී මහ බලවතෙකු බවට පත්වෙලා. ආර්ථික ආධාර, විදේශ ණය, යුද්ධ ආධාර, විශේෂඥ උපදෙස් හා කේ. ජී. බී. චරපුරුෂ සේවය වගේම සෝවියට් සමාජ අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණයට හා ආධිපත්‍යයට සේවය කරන තවත් අවියකි, සංස්කෘතික ආක්‍රමණය. සෝවියට් සංගමය තුළ රජවී ඇති නූතන සංශෝධනවාදය තුන්වන ලෝකයේ රටවලට කාන්දු කරවීමෙන් පීඩිත ජනතාවගේ විප්ලවීය ජීවගුණය ඇල්මැරීමත්, ඔවුන් තම අණසක තුළ හිරකර තබා ගැනීමත් එම සංස්කෘතික ප්‍රහාරයේ මූලික අරමුණුයි. සංශෝධනවාදී ක්‍රම විද්‍යාවක් මගින් උකහාගත් සාමකාමී සහජීවනය, මානව භක්තිය, යුද්ධ විරෝධය හා ලිංගික සබඳතා වටා ගෙතුණු නවකථා, කෙටිකථා, කවි, චිත්‍රපට, සංගීතය, නාට්‍ය මේ සඳහා අවි ලෙස බහුලව යොදගනී. සංශෝධනවාදී මතිමතාන්තර පතුරුවා හරින මෙම කලාකෘති මුළුමනින්ම වගේ අනුකාරකවාදීයි. ඒවායේ නිර්ව්‍යාජ සමාජවාදී ජීවගුණයක් හෝ අනන්‍යතාවයක් ඇත්තේම නැහැ. පූර්ව විප්ලවීය රුසියානු කලාකෘති සමග නූතන සෝවියට් කලාකෘති සසඳා බැලීමෙන් ඒවායේ අනුකාරකවාදීබවත්, පිරිහීමත් අපූරුවට දකගත හැකියි.

විශේෂයෙන්ම සෝවියට් හා නැගෙනහිර යුරෝපීය සිනමාව ප්‍රංශ, ජර්මන් හා අමෙරිකන් වානිජ සිනමාවේ බලපෑමට තදින්ම ගොදුරුවී ඇත. බොහෝවිට මේවායේ ප්‍රධාන නිමිත්ත ලිංගික සබඳතා සහ ප්‍රේමයයි. පුද්ගලිකත්වය හා මමත්වය හානිකර ලෙස ඉස්මතු කරනවා. සෝවියට් දේශයේ පවතින පංති ප්‍රතිවිරෝධතා හා අරගල කලාවෙන් මුළුමනින්ම පිටමංකර ඇත. සමාජ අධිරාජ්‍යවාදීන්ගේ තානාපති කාර්යාල, සංස්කෘතික මධ්‍යස්ථාන, මිත්‍ර සංගම්, ගුවන් විදුලි සේවා, ලේඛක පෙරමුණු, කලා පෙරමුණු හා සංස්කෘතික සංවිධාන හරහාය ආක්‍රමණය ගලා එන්නේ. මෙරට ඉතිහාසයේ ගමන් මඟත්, සමාජ අවශ්‍යතා හා සංස්කෘතික අරගලයත් අමතකකොට සමාජ අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා හා අරමුණු ඉටුකිරීමට ජනතාව යොමු කිරීමයි, මෙම ආයතන මගින් කෙරෙන්නේ. ඒ මෙරට සංස්කෘතික ගැටළු හා අවශ්‍යතා තේරුම් ගෙන සෝවියට් ජනතාව ඉදිරියට ගෙන ආ සහ ගෙනයන උරුමයෙන් නිසි ආලෝකය උරාගන්නවා වෙනුවට මෙරට ජනතාව මත සෝවියට් පාලක පංතියේ චින්තනය සියුම් ලෙස පැටවීමකි ●

සංස්කාරකවරු